# Speed Shrimp Mobile App

**Speed Shrimp ජංගම යෙදුම, තිරසාර ආර්ථික වර්ධනය තුළින් ඔබේ සිහින, බලාපොරොත්තු, සහ ඉලක්ක, සවිබල ගන්වයි.**





## Speed Shrimp ජංගම යෙදුමට දත්ත ඇතුලත් කිරීම සඳහා උපදෙස් මාලාව.

1. ගොවිපළේ නම.

   මේ සඳහා ඔබේ ගොවිපළේ නම යෙදිය යුතුයි.

2. ඉස්සන් ප්‍රභේදය.

   මේ සඳහා තෝරාගැනීමට දීඇති කොටුවෙන් ඔබ වගාකරන ඉස්සන් ප්‍රභේදය තෝරාගත යුතුය.

3. දිනය.

   ඔබ සාම්පලයක් ලෙස වගා පොකුණේ ඉස්සන්ගේ අවසාන වරට දේහබර කිරාබැලූ දිනය මේ සඳහා යෙදිය යුතුයි. (සෑම සතියකම එකම දවසක් මේ සඳහා යොදාගත යුතුය). එමෙන්ම පොකුණ සඳහා වියදම්කළ මුළු මුදල හා වගා පොකුණ සඳහා

පාවිච්චිකළ සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණය ඇතුලු අනෙකුත් දත්තත් එම දිනය දක්වා යාවත්කාලීනවූ දත්ත වියයුතුය.

4. පොකුණු අංකය.

ඔබ මුල්‍යමය විග්‍රහය ගණනය කිරීමට බලාපොරොත්තුවෙන පොකුණේ අංකය යෙදිය යුතුය.

5. ඔබේ මුදල් ඒකකය.

ඔබ භාවිතා කරන මුදල් ඒකකය යෙදියයුතුය. මින් ඉදිරියට ඔබ ඇතුලත් කරනා සෑම මුල්‍යමය තොරතුරක්ම එම මුදල් ඒකකයෙන්ම වියයුතුය.

6. පොකුණේ තැන්පත්කළ ඉස්සන් පැටවුන් සංඛ්‍යාව.

ඔබ පොකුණේ තැන්පත්කළ ඉස්සන් පැටවුන් සංඛ්‍යාව නිවැරදිව මෙතනදී ඇතුළත්කළ යුතුය. අභිජනනාගාරයෙන් ඔබට ප්‍රසාද දීමනාවක් ලෙස යම්කිසි ඉස්සන් පැටවුන් ප්‍රමානයක් වැඩිපුර ලබාදුන්නත්, එම අමතර පැටවුන් ප්‍රමානය නොසලකාහැර, ඔබ මෙතනදී ඇතුලත් කලයුත්තේ අභිජනනාගාරයෙන් ඔබ මිලදීගත් පැටවුන් ප්‍රමාණය පමනි.

7. ඉස්සන්ගේ වයස (DOC).

ඔබ මේ ජංගම යෙදුම භාවිතාකරන දිනයට අදාලව ඔබගේ ඉස්සන්ගේ වයස සඳහන් කලයුතුය. එමෙන්ම මේ ජංගම යෙදුම සඳහා ඇතුළත් කරනා අනෙකුත් සෑම දත්තයක්ම එම දිනය දක්වා යාවත්කාලීන වූ දත්ත වියයුතුය.

8. පොකුණේ වර්ගමීටර් ප්‍රමාණය.

පොකුණේ දිග මීටර් වලින් සහ පළල මීටර් වලින් වැඩිකර යෙදිය යුතුය. අක්‍රමවත් හැඩැති පොකුණුවල, ආසන්නම වර්ගමීටර් ප්‍රමාණය ඇතුළත්කළ යුතුය.

9. පසුගිය සතිය වනවිට ඉස්සන්ගේ දේහබර සාමාන්‍යය (average body weight) හා එම බරට අදාලව ඉස්සන් විකිණිය හැකිව තිබූ මුදල සඳහන්කළ යුතුය.

10. අද දිනය වනවිට ඉස්සන්ගේ දේහබර සාමාන්‍යය (average body weight) හා එම බරට අදාලව ඉස්සන් විකිණිය හැකි මුදල සඳහන් කළ යුතුය.

11. මේ සතියට පෙර සතියේ, දිනකට භාවිතාකළ ඉස්සන් ආහාර ප්‍රමාණයේ සාමාන්‍යය අගය.

මේ සඳහා පසුගිය සතියට පෙරසතිය සඳහා පාවිච්චි කළ සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණයේ එකතුව 7 න් බෙදා ඇතුළත් කළ යුතුය. (උදාහරණයක් ලෙස, අද දිනය මේ මාසයේ 14 වෙනිදානම්, මේ මාසයේ 1 දා සිට 7 වෙනිදා දක්වා පසුගිය සතියතුල ඔබ වගා පොකුණට භාවිතාකල සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණය 7න් බෙදීමෙන් ලැබෙන අගය මෙතැනට ඇතුලත්කල යුතුය).

12. මේ සතියේ, දිනකට භාවිතාකළ ඉස්සන් ආහාර ප්‍රමාණයේ සාමාන්‍යය අගය.

මේ සඳහා පසුගිය දින 7 සඳහා පාවිච්චිකළ සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණයේ එකතුව 7 න් බෙදා ඇතුළත්කළ යුතුය. (උදාහරණයක් ලෙස, අද දිනය මේ මාසයේ 14 වෙනිදානම්, මේ මාසයේ 8 දා සිට 14 වෙනිදා දක්වා මේ සතියතුල ඔබ වගා පොකුණට භාවිතාකල සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණය 7න් බෙදීමෙන් ලැබෙන අගය මෙතැනට ඇතුලත්කල යුතුය).

13. අද දිනය දක්වා පොකුණ සඳහා භාවිතාකළ සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණය.

මේ සඳහා පොකුණේ පැටවුන් තැන්පත්කළ දින සිට අද දක්වා භාවිතාකළ සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණයේ එකතුව ඇතුලත්කළ යුතුය.

14. මේ දක්වා පොකුණට වියදම්කළ සම්පූර්ණ මුදල.

මෙම දත්තය ඇතුළත් කිරීමේදී ඉස්සන් ආහාරවලට නොමැතිව පොකුණ සඳහා වියදම්කළ අනෙකුත් වියදම් සියල්ල ඇතුළත්විය යුතුය. වගාව සඳහා පොකුණ කුළියට හෝ බද්දට ලබාගෙන ඇත්නම් සම්පූර්ණ කන්නය සඳහාම එම මුදල, පොකුණු සැකසීමේ වියදම, ඉස්සන් පැටවුන්ට සහ ප්‍රවාහනය සඳහා ගිය වියදම්, අද දිනය දක්වා සම්පූර්ණ සේවක වේතන, විදුලි බලය සඳහා වැයවූ මුදල් (මේ දක්වාගෙවූ මුදල් වලට අමතරව අද දක්වා ගෙවිය යුතවූ මුදල උපකල්පනයකර යෙදිය යුතුය). ඊට අමතරව ජෙනරේටර් සහ වාහන සඳහා ඉන්ධන වියදම්, පොකුණ සඳහා භාවිතාකළ හුණු අලු ඩොලමයිට් ඇතුළු සියලුම යෙදවුම්වලට ගිය වියදමත්, තේ, ආහාර, ඖෂධය හා සේවක සුභ සාධනය සඳහා වියදම් කළ සම්පූර්ණ මුදලත් ඇතුළත් කළයුතුය. නමුත් ප්‍රධාන ආයෝජනය යටතට ගැනෙනා, ගොඩනැගිලි ඉදිකිරීම්, ජෙනරේටර්, වතුර මෝටර්, පැඩල්වීල් මිළදීගැනීම් වැනිදෑ ඇතුලත් නොවියයුතුය.

15. ඉස්සන් ආහාර කිලෝවක මිළ.

මේ සඳහා ඔබට ඉස්සන් ආහාර සැපයුම්කරු විසින් ඉස්සන් ආහාර කිලෝවක් සඳහා අයකරන මුදලේ සාමාන්‍යය අගය ඇතුළත්කළ යුතුය. සැපයුම්කරු විසින් ඔබහට ඉස්සන් ආහාර ලබාදෙන්නේ ණය පදනම යටතේනම්, කන්නය  අවසානයේදී ඔබ විසින් ඉස්සන් ආහාර කිලෝවක් සඳහා ගෙවියයුතු මුදල සඳහන්කළ යුතුය.

16. අස්වැන්නෙන් කොටසක් ඔබ කලින් නෙලාගත්තේ නම්, එහි විස්තර.

මෙහිදී ඔබ අස්වැන්න නෙලාගන්නා අවස්ථාවේදී ඉස්සන්ගේ දේහබර, කිලෝ ප්‍රමාණය, හා කිලෝවක් විකුණූ මුදල සඳහන්කළ යුතුය.

ඔබ කිහිපවාරයක් කොටස් වශයෙන් අස්වැන්න නෙලාගත්තේ නම්, එයට අදාලව කොටස් වශයෙන් නෙළාගත් අස්වැන්නේ විස්තර, වෙන වෙනම ඇතුළත් කළ යුතුය.

˜ Speed Shrimp ˜ ඔබේ ඉස්සන් ගොවිපල පිළිබඳ සියලුම වැදගත් මෙහෙයුම් තොරතුරු විශ්ලේෂණය කර එය ඔබේ ඇඟිලි තුඩුවල තබයි. ක්ලික් කිරීම් කිහිපයක් සමඟින්, ඔබට දැන් ඔබේ වගාව පිළිබඳව අවශ්‍ය සියලුම දත්ත වෙත වේගයෙන් ප්‍රවේශ විය හැක. ඔබට, ඔබගේ ආයෝජනය සඳහා උපරිම ආරක්ෂාවක් සහතික කරගන්නා අතරම බාධාවකින් තොර මූල්‍ය විශ්ලේෂණයන් භුක්ති විඳීමට ˜ Speed Shrimp ˜ ජංගම යෙදුම දැන් ඔබගේ ස්මාර්ට් ජංගම දුරකතනයේ App Store හෝ Play Store වෙත පිවිස, බාගත කරගන්න.

සතුටුදායක සහ තිරසාර වගාවේ ප්‍රතිලාභ භුක්ති විඳීමට පටන් ගන්න....!

